**රඹෑව ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රඹෑව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව අස්ථිත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු එම කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළයුතු වුවත් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අයවැයගත තොරතුරු රහිතව ඉදිරිපත් කර තිබුණි. | පිළිගනිමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ ණයහිමි ශේෂය තුළ ඇති රු.1,730,000 ක ව්‍යාපෘති ආරම්භ කර නොතිබියදීත් ණයහිමි ශේෂ වශයෙන් හඳුනාගෙන තිබුණි. | පෙර වර්ෂවල ණය හිමි ශේෂයන් ලෙස දක්වා තිබුණි. | වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘතිවල වටිනාකම ණයහිමි ශේෂ වශයෙන් හඳුනා නොගත යුතුවේ. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව ණයහිමියන්ගේ අඩු/වැඩිවීම සහ වෙනත් ජංගම වගකීම්වල අඩු වැඩිවීම යටතේ රු.27,136,744 ක වටිනාකමක් පැවතියද සමාලෝචිත වර්ෂයට අදාළව හා පෙර වර්ෂයට අදාළව වත්කම් හා වගකීම් ප්‍රකාශය සංසන්දනය කිරීමේදී එවැනි වටිනාකමක් හඳුනාගත නොහැකිවිය. | පිළිගනිමි. | නිවැරදි මුදල් ප්‍රමාණයන් හඳුනාගෙන ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතුය. |
| (ඇ) | ලෙජර් ගිණුම් අනුව රු.1,065,559 ක වටිනාකමක් සහිත වත්කම් මිලට ගෙන තිබුණු නමුත් එම වත්කම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය යටතේ දේපළ, පිරියත හා උපකරණ මිලට ගැනීම් ලෙස දක්වා නොතිබුණි. | | |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 15 කට අදාළව වත්කම් හා වගකීම් ප්‍රකාශයේ සඳහන් වටිනාකම් සහ උපලේඛනවල සඳහන් වටිනාකම් අතර රු.583,134 ක වෙනසක් විය. | ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනසටහේතු සොයා බලා ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.4** **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.2,782,068 ක්වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | තොරතුරු සොයා බලා මහ සභාවේ අවසරය ගෙන ශේෂ කපාහැරීමට කටයුතු කරමි. | උපලේඛන යාවත්කාලීන කර ශේෂ සනාථන ලිපි ඉදිරිපත් කළ යුතුවේ. |

**1.7** **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික හා අනියම් සේවකයන් සේවය අවසන් කිරීමේදී ඔවුන්ට පාරිතෝෂික ගෙවීම් සඳහා වු යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්ත භාරකාර අරමුදලට දායක වී ඇත. | අදාළ පනත අනුව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු සක්‍රීය වාහන 07 ක චක්‍රලේඛ ප්‍රකාර ඉන්ධන දහන පරීක්ෂණ සිදුකර නොතිබුණි. | දැනට ධාවනයේ යෙදෙන වාහන පමණක් ඉන්ධන පරීක්ෂා කර ඇත. බර වාහන ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට තරම් ධාවනයේ යෙදී නොමැත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආයභාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු.25,728,099 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.14,817,273 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.1,169,384 ක හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලැබුණු විගස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා දේපළ තක්සේරු කිරීමට කටයුතු කරමි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | **කුලී** | | |
| (i) | 2020 සහ 2021 වර්ෂවල වත්කම් කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු රු.262,270 ක් අයකරගෙන නොතිබුණි. | තවදුරටත් අයකිරීමට ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | වත්කම් කුලියට දීමෙන් ලැබිය යුතු සියලු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | බල ප්‍රදේශයේ පිහිටි වාර්ෂිකව බදුදෙන වත්කම් 04 ක් බදුදීම් වෙනුවෙන් 2021 වර්ෂයට අයවිය යුතු රු.664,484 ක්ද පූර්ව වර්ෂ වෙනුවෙන් අයවිය යුතු රු.1,151,033 ක්ද අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදුකරමින් පවතී. | වත්කම් බදු දීම වෙනුවෙන් අයවිය යුතු සියලුම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ බලපත්‍ර ගාස්තු රු188,000 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු කැබ්රථයක් 2019 මැයි 16 දින අනතුරට පත්වීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂණය අනුව රියදුරුගෙන් රු.1,107,300 ක් අයකරන ලෙසත් එම මුදලින් සියයට 50 ක් කඩිනමින් හා ඉතිරිය රු.92,276 බැගින් වාරික 06 කින් අයකරන ලෙසත් උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් 2020 මැයි 22 දිනැති ලිපියෙන් පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා තිබුණු නමුත් 2021 දෙසැම්බර් 20 දින වනවිට එම මුදලින් රු.350,000 ක් පමණක් අයකරගෙන තිබුණි. මෙම වාහනය අළුත්වැඩියා නොකර පෞද්ගලික ගරාජයක් තුළ වසර 2 ½ ක පමණ කාලයක සිට දිරාපත් වෙමින් පැවතුණි. | පිළිගනිමි. | වාහනය අළුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් පැරණි පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය නියමිත පරිදි ඉටුවී නොමැති බව වාර්තා කර තිබියදී ඒ පිළිබඳ නොසලකා කිසිදු පරීක්ෂණයකින් තොරව 2020 ඔක්තෝබර් 12 දින අතරුඳවුම් රු.324,149 ක් නිදහස් කිරීමට සභාව කටයුතු කර තිබුණි. | පිළිගනිමි. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) | 2017 වර්ෂයේදී ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් මධ්‍යම රජයෙන් රු1.730,000 ක් ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී හෝ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිගනිමි. | අදාළ ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොරතුරු සොයාගත නොහැකි ගෙවිය යුතු රු.1,670,740 ක පැරණි ශේෂ 10 ක් පැවති නමුත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | මෙම ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2017 වර්ෂයේදී සභාව වෙත ලබාදී තිබුණු වාහන 05 ක අයිතිය සභාවේ නමින් ලබා ගැනීමට 2021 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | වාහන කඩිනමින් පවරා ගැනීමට කටයුතු කරමි. | සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |